// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2180/24 - 2020 ජුනි මස 17 වැනි බදාදා - 2020.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

DIK/LAN/02/58.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර* :

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 452, දික්වැල්ල උතුර ග්‍රාම නිලධාරි වසමේ දඹගස්ආර ගමේ පිහිටි මාතර ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක මු. පි. මාර 2832 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස්:

01. **කැබලි අංකය: 01**
ඉඩමේ නම: කළුවෙගහකොරටුව; විස්තරය: විවෘත මුඩුබිම: හිමිකම් කියන අය: එම්. එම්. ලීලාරත්න, දඹගස්ආර, වලස්ගල, දික්වැල්ල; ඉඩම් ප්‍රමාණය : හෙක්. 0.0099.

02. **කැබලි අංකය: 02**
ඉඩමේ නම: අරුවේගහහේන; විස්තරය: ගෙවත්ත, අවු. 50 -60 ක් පමණ වයසැති මිශ්‍ර භෝග වගාවක් ඇත: හිමිකම් කියන අය: එම්. එම්. ලීලාරත්න, දඹගස්ආර, වලස්ගල, දික්වැල්ල; ඉඩම් ප්‍රමාණය : හෙක්. 0.4349.

03. **කැබලි අංකය: 03**
ඉඩමේ නම: විල්ලපත්තිනිගහවත්ත; විස්තරය: ගෙවත්ත, මිශ්‍ර භෝග වගාවක් ඇත: හිමිකම් කියන අය: එම්. එම්. ලීලාරත්න, දඹගස්ආර, වලස්ගල, දික්වැල්ල; ඉඩම් ප්‍රමාණය : හෙක්. 0.0273.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 ජුලි මස 15 වැනි දින පෙ. ව. 10.30 ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 ජුලි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

සුසන්ත අත්තනායක,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2020 ජුනි මස 08 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
දික්වැල්ල.

7-112

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: BKP/LAND/ACQUI/D2/1/1.
*ඉඩම් අමාත්‍යාංශ අංකය*: 4-3/15/2016/VE/101.

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2016 නාය යාමෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම කරඳවත්ත නැමති ඉඩම අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අත්පත් කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැගල්ල ග්‍රාම නිලධාරි වසමේ වැලතුඩුව ගම තුළ පිහිටි කෑගල්ල මැනුම් අධිකාරියේ අංක මු. පි. කැ. 3723 දරන මුලික පිඹුරේ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අංක 1, 2, 3 (03) ක්වේ.

01. **කැබලි අංකය: 01, 02, 03**

ඉඩමේ නම: කරඳවත්ත; හිමිකම් පාන්නන්ගේ නම් සහ ලිපිනයන්: (01) කළමණාකරන අධ්‍යක්ෂ, කැලණි වැලි වැවිලි සමාගම, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10. (02) සභාපති, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, අංක 55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02 ; ප්‍රමාණය : හෙක්. 10.047.

*වන්දි හිමිකම් පරීක්ෂණ දින* :

මු. පි. කැ. 3723 පිඹුරේ කැබලි අංක 1, 2, 3 (03) සඳහා 2020.08.20 වැනි දින පෙ. ව. 10.00.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ඉහත සඳහන් දිනයන් හි හා වේලාවන් හිදී බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020.08.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ජේ. එම්. රම්‍යා ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්/
ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරි,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බුලත්කොහුපිටිය.

2020 ජුනි මස 03 වැනි දින,
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-113

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.